**ශීර්ෂය 267- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයේ ඡේදයට යොමුව | නිර්දේශය | සමාලෝචිත වර්ෂයේ ඡේදයට යොමුව |
|---|---|---|
| 1.6.1 (ඇ) | භාණ්ඩාගාර පොත් සමඟ සසඳා ගිණුම් පිළියෙල කළ යුතු ය. | 1.6.1 (ආ)(i) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් වර්ග 02ක් මිලදී ගැනීමේ පිරිවැය රු.5,497,585ක් ලෙස දක්වා තිබූ නමුත් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් (SA - 82)හි එය රු.2,800,845ක් වශයෙන් දැක්වීම හේතුවෙන් රු.2,696,740ක වෙනසක් පැවැතුණි. | පරිගණක තොරතුරු පද්ධතියේ දෝෂයක් (Web Interface) හේතුවෙන් මෙලෙස සිදුවී තිබූ අතර නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |

**(ආ) දේපළ, පිරියත සහ උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පසුගිය වර්ෂයේ අවසාන දිනට මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.1,270,479,547ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.1,355,692,400ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් රු.85,212,853ක වෙනසක් පැවතිණි. | New web cigas assests management වෙත Email මාර්ගයෙන් සංශෝධනය කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.1,432,058,050ක් සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය සමග සැසඳීමේදී එහි වටිනාකම එකතුව රු.1,454,597,866ක් වූයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.22,539,816කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වටිනාකම ඉදිරි කාලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආකෘතිය වෙනස් කිරීමේදී නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි එකතු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතු වේ. |

(ඇ) **අග්‍රිම ශේෂ**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජූලි 04 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාණ්ඩාගාරයට නිරවුල් කර තිබූ අග්‍රිම ශේෂ රු. 27,158,000ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිරවුල් නොකළ වැඩ අත්තිකාරම් ගිණුම් ශේෂ ලෙස හා මුදල් හා මුදල් සමාන දෑ ලෙසත් වැරදියට දක්වා තිබූ බව අනාවරණය විය. | ඉදිරි කාලයේදි මෙවැනි දෝෂ සම්පූර්ණයෙන් වලක්වනු ලැබේ. | **නිරවුල් නොකළ වැඩ අත්තිකාරම් නිවැරදිව ගිණුම් තැබීමට ක්‍රියාමාර්ග ගෙන මෙම දෝෂ නිවැරදි කළයුතු වේ.** |

(ඈ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ "හරිත රටක්" ජාතික ගෙවතු වගා විප්ලවය සහ ඒ ආශ්‍රිත සංවර්ධන යෝජනා ක්‍රම සඳහා රු. මිලියන 200.8ක් ලබා දී තිබූ නමුත් අනුමත කළ ප්‍රතිලාභීන්, තෝරා ගැනීමේ අයදුම්පත්, තෝරා ගැනීමේ නිර්ණායක, බෝග ප්‍රරෝහණ පරීක්ෂණ වාර්තාව, ග්‍රාමීය, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ක්‍රියාකාරකම්වල ප්‍රගති වාර්තා, වගාවෙන් අස්වැන්න හෝ ප්‍රතිඵල, වගාවන්ගෙන් අපේක්ෂික තක්සේරු මට්ටම සහ රජයේ ආයතන ඒකක 139කට සපයනු ලැබූ | ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | සම්බන්ධිත සියළුම ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගතයුතු වේ. |

කෘෂිකාර්මික උපකරණවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | නිරීක්ෂණය වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2,632,447 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකළ හා කල් ඉකුත් වූ තැන්පතු 32ක් සම්බන්ධයෙන් ඵලදායී පියවර නොගෙන පසුගිය වර්ෂ 02 සිට 04ක් දක්වා පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | අක්මුදල් ලැබූ පසු කටයුතු කරනු ලැබේ. | තැන්පතු අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට හා කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ඵලදායී පියවර ගැනීමටත් කටයුතු කළයුතු වේ. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **XXIV** පරිශිෂ්ඨයේ 4 වගන්තිය | 122,391 | සේවය අත්හිටවූ, සේවකයින් 02කගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ රු.144,335ක් අයකිරීමට පසුගිය වර්ෂ 05කට අධික කාලයක් පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සුදුසු පියවර ගෙන නොතිබුණි. | අයකිරීමට පියවර ගෙන ඇත. | අයකිරීමට කඩිනමින් සුදුසු පියවර ගතයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ලේකම් කාර්යාලයේ විවිධ අංශවල රාජකාරි ඉටුකරන නිලධාරීන්ට සංවර්ධන ව්‍යාපෘති 04ක් සඳහා ලබාදුන් පරිපාලන වියදම් වැය විෂයට අදාල මූල්‍ය ප්‍රතිපාදනවලින් එම ව්‍යාපෘති කාර්යයන්ට අදාල නොවූ රාජකාරිවල යෙදුණු නිලධාරීන්ට අතිකාල හා නිවාඩු දින වැටුප් එකතුව රු.836,346ක් ගෙවා තිබූ අවස්ථා 25ක් නිරීක්ෂණය විය. | සුදුසු පිළිතුරු ලබාදී නොමැත. | මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධ රාජකාරිවල පරිපාලන වියදම් පමණක් ගෙවීමට කටයුතු කළයුතු වේ. |

### 2.2 අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවීන්ගෙන් වී මිලදීගෙන විකිණීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිදු ගිවිසුමකින් තොරව විවිධ සේවා සමූපකාර සමිති දෙකක් වෙත වී මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේ ලබාදුන් අත්තිකාරම් එකතුව රු. 20,729,785කින් එකතුව රු. 17,634,125ක් හෙවත් සියයට 85ක් නිරවුල් කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අත්තිකාරම් ආපසු ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් එකතුව රු. මිලියන 183.9ක පිරිවැයකින් ඉදිකර ජනතාවට ලබාදුන් නිවාස 118ක් පසුගිය වර්ෂ 06 සිට 10ක් දක්වා කාලයක් පදිංචිකරුවන් විසින් භාවිතා නොකර පැවතුණි. | ආර්ථික, අධ්‍යාපන හා සෞඛ්‍ය හේතූන් මත වෙනත් ප්‍රදේශ වෙත ගොස් ජීවත් වීම නිසා මේවා භාවිතා කිරිමට නොහැකි වී තිබේ. | එම නිවාස තවදුරටත් ඵලදායි අන්දමින් භාවිතා කිරීමට කටයුතු සිදුකළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 24.19ක පිරිවැයකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ භාණ්ඩ අයිතම 481ක් සහ පහසුකම් සහිතව සෙල්වපුරම්හි ඉදිකර තිබූ අනාරක්ෂිත හා අතවරයට ලක්වූ ළමුන් වෙනුවෙන් වූ ආරක්ෂිත මධ්‍යස්ථානය පසුගිය වර්ෂ 08ක කාලයක් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර නොගෙන නිශ්කාර්යව පැවැතුණි. | විගණන නිරීක්ෂණයට අදාළ වන පරිදි පිළිතුරු ලබා දී නොතිබුණි. | අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගතයුතු වේ. |
| (ඇ) | 2020 වර්ෂයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරිගම ව්‍යාපෘතිය මගින් රු. මිලියන 1.48කට මිලදීගෙන තිබුණු තෙල් නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අධිබලැති විදුලි සම්බන්ධතා පහසුකම් නොමැති තිරුමුරුගන්ඩි ග්‍රාම සංවර්ධන සමිතියට භාරදී තිබීම හේතුවෙන් මෙම යන්ත්‍ර උචිත අරමුණු සඳහා මේ දක්වා භාවිතා නොකර දෝෂයන්ට ලක්වන තත්ත්වයේ පැවැතුණි. | විදුලි සම්බන්ධතා ලබාදීමෙන් පසුව භාවිතා කරනු ලැබේ. | මිලදී ගත් අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට ඵලදායි පියවර ගතයුතු වේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් විදුලි ජනක යන්ත්‍රයක් වර්ෂ 06ක කාලයක් භාවිතා කර නොතිබුණි. එසේම, 2016 දෙසැම්බර් මාසයේදී රු. මිලියන 9.8කට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන විදුලි විසන්ධි වීමකදී පමණක් භාවිතා කිරීමට මිලදී ගෙන තිබුණු කි.වො. 502 (502KW**)** අධිබලැති තවත් විදුලි ජනකයක් යන්ත්‍ර පැය 385ක් ක්‍රියා කිරීමෙන් පසු අක්‍රීය වී තිබුණි. | ප්‍රතිපාදන ලැබූ විට අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. | අළුත්වැඩියා කර ඵලදායි අයුරින් භාවිතා කිරීමට උචිත පියවර ගතයුතු වේ. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ තුනුක්කායි, පුදුකුඩියිරුප්පු, වැලිඔය, ඔඩ්ඩුසුඩාන් ආදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාවිතා කළ වාහන 13ක් එකී සභාවලට අයත්ව නොතිබුණි. | හිමිකාරිත්වය මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | හිමිකාරිත්වය මාරු කිරීමට උචිත පියවර ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තුනුක්කායි සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාවිතා කළ වාහන 15ක් වර්ෂ 03කට අධික කාලයක් අළුත්වැඩියා තත්ත්වයේ පැවැතුණි. කෙසේ වෙතත්, ඒවා අළුත්වැඩියා කර භාවිතා කිරීමට මේ දක්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුල්‍ය ප්‍රතිපාදන ලැබූ විට අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලැබේ. | අළුත්වැඩියා කර ඵලදායි අයුරින් භාවිතා කිරීමට උචිත පියවර ගතයුතු වේ. |
| (ඈ) | 2019 සැප්තැම්බර් 10 දින මුල්ලියවලෙයිහි ලෝක ආහාර වැඩසටහන සඳහා ගබඩාවේ තබා තිබූ යතුරු පැදි 03ක් සහ ලොරි රථ 02ක් සමාලෝචිත වර්ෂයේ භෞතික පරීක්ෂාවන්ට ලක් වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | සම්බන්ධිත ලේඛන, පොත්පත් භෞතික පරීක්ෂාවට ඉදිරිපත් කිරිමට පියවර ගතයුතු වේ. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2022 මාර්තු 16 දිනැති අංක 04/2020 දරන චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක ඇප තැබිය යුතු නිලධාරීන් 27කගෙන් ලබාගත යුතු ඇප මුදල් එකතුව රු. 294,000ක් මේ දක්වා ලබාගෙන නොතිබුණි. | ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ඇප මුදල් ලබා ගැනීමට පියවර ගතයුතුවේ. |

**3.4 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06කට අයත් බවට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවැති ඉඩම් හිමිකම් ඔප්පු/ පවරා ගැනීමේ නියෝග සහ මිනින්දෝරු සැලැසුම් ආදිය පසුගිය වර්ෂ 10කට අධික කාලයක් විගණනයට ලබාදී නොතිබූ අතර ඒවා ලබාගෙන සාධාරණ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට මේ දක්වා ඵලදායි පියවරද ගෙන නොතිබුණි. | මේ සම්බන්ධ මෙහෙයුම් කඩිනමින් ආරම්භ කෙරේ. | හිමිකම් ඔප්පු සහ ඉඩම්වල වපසරියත් සනාථ කර ලබාගෙන එහි සාධාරණ වටිනාකම රජයේ තක්සේරුකරු මගින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ඵලදායි පියවර ගතයුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ එහි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විවිධ කාර්ය මණ්ඩල සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාව 702න් පුරප්පාඩු 120ක් අඛණ්ඩව පැවැතුණි. | බඳවා ගැනිමට කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවා ගැනිම් සිදුකිරීමට කටයුතු කළයුතු වේ. |

## 5. තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 01 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන දර්ශක ළඟාකර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟාකර ගැනීමට සිදුකළ යුතු මෙහෙයුම් සහ එහි ප්‍රගතිය මැනීම සඳහා දර්ශක ආදිය වර්ෂ 05ක සිට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කරමින් පවතී. | එම දර්ශක හඳුනාගෙන වාර්ෂික ළඟාකර ගැනීම් තක්සේරු කර 2023 වර්ෂය වන විට එම අරමුණු ළඟාකර ගැනීමට ඵලදායි පියවර ගතයුතු වේ. |